**ශීර්ෂය 293 රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව**
------------------------------------------------------------

**1. මූල්‍ය ප්‍රකාශන**
------------------

1.1 **මතය**
-------

රබර් සංවර්ධන දෙපාර්තමේන්තුවේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව රබර් සංවර්ධන දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2022 ජූනි 17 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2022 ඔක්තෝබර් 27 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

2021 දෙසැම්බර් 31 දිනට රබර් සංවර්ධන දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 **මතය සඳහා පදනම**
-----------------------

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 **මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**
----------------------------------------------------------------------------------------------------------

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවාද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පැදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මම ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට ,

(ආ) මෙම වාර්තාවේ ඡේද අංක 3.3 මගින් දක්වා ඇති නිරීක්ෂණ සම්බන්ධයෙන් ඉකුත් වර්ෂයේදී මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 වියදම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ පුනරාවර්තන වැය විෂයයන් 02 ක් සඳහා සලසා තිබුණු එකතුව රු.23,100,000 ක ප්‍රතිපාදනවලින්, එකතුව රු.13,320,000 ක් උපයෝජනය කර නොතිබුණි. ඒ අනුව වර්ෂය අවසාන වන විට එම වැය විෂයන්වල ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 20 ක සිට සියයට 100 ක් දක්වා සැලකිය යුතු පරාසයක පැවතිණි. | **2020** වර්ෂයේ දෙසැම්බර් වාහන කුලී බිල්පත සඳහා එම වර්ෂ අවසානයේදීම ගෙවීමට ඉදිරිපත් වීම හේතුවෙන් සහ **2021** වර්ෂයේ රාජ්‍ය වියදම් සමාලෝචනය යටතේ වියදම් පාලනය කිරීම හේතුවෙන් වූ ඉතිරි වීමකි. | ලබාදී ඇති පරිදි ප්‍රතිපාදන සම්පූර්ණයෙන්ම උපයෝජනය කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ ප්‍රාග්ධන වැය විෂයයන් 04 ක් සඳහා සලසා තිබුණු එකතුව රු.15,000,000 ක ප්‍රතිපාදනවලින්, එකතුව රු.7,263,677 ක් උපයෝජනය කර නොතිබුණි. ඒ අනුව වර්ෂය අවසාන වන විට එම වැය විෂයන්වල ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 30 ක සිට සියයට 100 ක් දක්වා සැලකිය යුතු පරාසයක පැවතිණි. | රජය විසින් ආනයන සීමා කිරීම හේතුවෙන් කාර්යාල ගතව පවතින යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ නඩත්තුව සහ අලුත්වැඩියාව සඳහා අවශ්‍ය අමතර කොටස් සපයා ගැනීමේ දුෂ්කරතාවය හේතුවෙන් සමහර අත්‍යාවශ්‍ය අලුත්වැඩියාවන් ඉටු කර ගැනීමට නොහැකිවීම සහ කොරෝනා වසංගත තත්ත්වය හේතුවෙන් මෙම ප්‍රතිපාදන ඉතිරිවීමට හේතු විය. | ලබාදී ඇති පරිදි ප්‍රතිපාදන සම්පූර්ණයෙන්ම උපයෝජනය කළ යුතුය |

**2.2** බැරකම් හා බැදීම්වලට එළඹීම

-----------------------------------

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| මුදල් රෙගුලාසි 94(1) පරිදි දරන ලද බැරකම් හා වැය ප්‍රමාණය කිසිම විටක වර්ෂය සඳහා ප්‍රතිපාදන මුදල් නොඉක්ම විය යුතු වුවද 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂයේදී සංවර්ධන සහායන් සඳහා වූ වැය විෂයය යටතේ ප්‍රතිපාදන ඉතිරිය රු.3,192,086 ක් වුවද, බැරකම වටිනාකම රු.45,622,099 ක් වූ හෙයින් ඉතිරිය ඉක්මවූ බැරකම් වටිනාකම රු.42,430,013 ක් විය. | මු.රෙ. **94(2)** හි සඳහන් ප්‍රතිපාදන සීමාව ඉක්මවා බැඳීම් හා බැරකම් නොමැත. එනමුත් බැරකම් ඉතිරි සීමාව ඉක්මවා කටයුතු නොකිරීමට අදාළ නිලධාරීන්ට උපදෙස් ලබාදීමට කටයුතු කර ඇත. | ප්‍රතිපාදන සීමාව ඉක්මවා බැඳීම් හා බැරකම් ඇති නොවීමට කටයුතු කළ යුතුය. |

**2.3** නීති,රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

-------------------------------------------

| නිරීක්ෂණය | | | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- | --- |
| **නීති,රීති හා රෙගුලාසිවලට යොමුව** | **වටිනාකම** | **අනුකූල නොවීම** | | |
| | රු. | | | |
| 2021 නොවැම්බර් 26 දිනැති අංක 2021 /03 දරන රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ චක්‍රලේඛයේ 7.6 ඡේදය | 3,519,253 | රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුමේ හරස් සටහන් මගින් ලැබීම් සහ ගෙවීම් මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ ඇතුළත් කළ යුතු වුවද හරස් සටහන් මගින් ලැබීම් රු.3,519,253 ක් හා හරස් සටහන් මගින් ගෙවීම් රු. 3,519,253 ක් ඇතුළත් කර නොතිබුණි. | මුදලින් නොවන අත්තිකාරම් (මාරු පත්‍ර මගින්) ලැබීම් හා ගෙවීම් ලෙස සටහන් කිරීමක් චක්‍රලේඛය අනුව සිදු කළ යුතු යැයි සඳහන් කර ඇති බැවින් ඉදිරියේදී එම සටහන ඇතුළත් කරන බව කාරුණිකව සඳහන් කරමි. | චක්‍රලේඛ උපදෙස් පරිදි කටයුතු කළ යුතුය. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**------------------------------**

**3.1 කාර්යභාරයන් ඉටු නොකිරීම**

-----------------------------------

| **විගණන නිරීක්ෂණය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| **---------------------** | **----------------------------** | **---------** |
| රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව සඳහා රබර් තොරතුරු කළමනාකරණ පද්ධති මෘදුකාංගයක් සංවර්ධනය කිරීමේ අරමුණින් රු.**2,000,000** ක් ඇස්තමේන්තු කර තිබුණු අතර එම කාර්යය ඉටුකර ගැනීමට නොහැකිවී තිබුණි. | රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව සඳහා රබර් තොරතුරු කළමනාකරණ පද්ධති මෘදුකාංගයක් සංවර්ධනය කිරීමේ අරමුණින් ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනයේ (ICTA) උපදේශකත්වය යටතේ ක්‍රියාත්මක වූ ව්‍යාපෘතිය යටතේ, අදාළ කාර්යභාරය ඉටු කිරීම සඳහා ප්‍රසම්පාදනය පිරිනමන ලද ආයතනය එම ව්‍යාපෘතියෙන් ඉවත් වීම මෘදුකාංග සංවර්ධනය සඳහා සුදුසු ආයතනයක් තෝරා මෘදුකාංග සංවර්ධනය කිරීම හෝ මුදල් ගෙවීමට එම වසර තුළ හැකියාවක් නොමැති විය. | සැලසුම් කරන ලද කාර්යයන් ඉටුකර ගැනීමට කටයුතු කළ යුතුය. |

**3.2 මුදල් නිදහස් කර තිබුණත් ප්‍රගතියක් ලබා නොතිබුණු ව්‍යාපෘති**

**-----------------------------------------------------------------**

| **විගණන නිරීක්ෂණය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| **---------------------** | **----------------------------** | **---------** |
| 2021 දෙසැම්බර් 31 දින වන විට කොම්පෝස්ට් පොහොර සකස්කිරීම සඳහාවූ බහුකාර්යය කැබලිකිරීමේ යන්ත්‍ර 42 ක් මිළදී ගැනීමට දෙපාර්තමේන්තුව රු.15,210,090 ක් රජයේ කර්මාන්ත ශාලාව වෙත ලබාදී ඇතත් 2022 මැයි මාසයේ යන්ත්‍ර 08 ක් සහ අගෝස්තු මාසයේ යන්ත්‍ර 06 ක් වශයෙන් යන්ත්‍ර 14 ක් ලැබී තිබුණි. ඒ අනුව 2022 සැප්තැම්බර් මාසය වන විට මුදල් ගෙවා මාස 09 ක් ගතවී තිබුණු නමුත් ඉතිරි යන්ත්‍ර 28 ක් ලබා ගෙන නොතිබුණි. මෙම ප්‍රමාදය හේතුවෙන් අදාළ කොම්පෝස්ට් ව්‍යාපෘතිය නියමිත පරිදි සිදුකිරීමට නොහැකිවී තිබුණි. | අදාළ යන්ත්‍ර ආනයනය ප්‍රමාදවීම මත සැපයීම කටයුතු ප්‍රමාදවන බව රජයේ කර්මාන්ශාලාව විසින් සඳහන් කර ඇත. | සැලසුම් කළ කාර්යභාරය නිසි අයුරින් ඉටු කළ යුතුය. |

**3.3** පාඩු හා හානි

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට අලාභහානි සිදු වී වර්ෂ 03 ක සිට වර්ෂ 07 ක් අතර කාල පරාසයක් ගත වී ඇති සිද්ධීන් 09 ක් සම්බන්ධයෙන් එකතුව රු.3,159,640 ක් වූ පාඩු හා හානිවීම් අයකර ගැනීමට හෝ කපා හැරීමට කටයුතු කර නොතිබුණි. | වර්ෂ **03** ත් වර්ෂ **07** ත් අතර කාලයක් ගතවී ඇති සිද්ධි **09**ක් සම්බන්ධයෙන් රු**.3,159,640** ක පාඩු හා හානි සම්බන්ධයෙන් කටයුතු අවසන්ව නොමැති අතර**,** වාහන කිහිපයකම නීතිමය කටයුතු අවසන් වී නොමැති වීමද එයට හේතුවක්ව ඇත**.** | වාහන සඳහා වූ අලාභ අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

**3.4** අනාර්ථික ගනුදෙනු

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| රබර් සංවර්ධන දෙපාර්තමේන්තුවට ගොඩනැගිල්ලක් ඉදිකිරීම සඳහා 2009 වර්ෂයේ දී පර්චස් 75 ක් රු.66,700,000 ක් වටිනා ඉඩමක් මිල දී ගැනීමට නාගරික සංවර්ධන අධිකාරීය වෙත රු.59,304,347 ක් ගෙවා තිබුණි. එසේම එම ඉඩමේ ගොඩනැගිල්ල ඉදිකිරීමට සහ සැලසුම සකස් කිරීමට ගොඩනැගිලි දෙපාර්තමේන්තුවට රු.150,000 ක් 2009 වර්ෂයේදී ගෙවීම් කර රු.මිලියන 249 ක ඇස්තමේන්තුවක්ද සකස් කර ගෙන තිබුණි. මෙම මූලික කටයුතු අවසන් කර වර්ෂ 11 ක් පමණ ගත වී ඇතත් හිඟ මුදල ගෙවා දෙපාර්තමේන්තුව වෙත ඉඩම පවරා ගැනීමේ කටයුතු සහ ඉඩමේ ඉදිකිරීම් කටයුතු මෙතෙක් සිදු කර නොතිබුණු අතර 2017 පෙබරවාරි මාසයේ සිට සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම දෙපාර්තමේන්තුව කුලියට ගත් පෞද්ගලික ගොඩනැගිල්ලක පවත්වාගෙන යමින් තිබුණි. | නාගරික සංවර්ධන අධිකාරිය වෙතින් මිල දී ගත් ඉඩම විධිමත්ව පවරා ගැනීමට 2019 වර්ෂයේදී කටයුතු කළ අතර, ඒ අනුව 2020 අගෝස්තු 28 දින නාගරික සංවර්ධන අධිකාරිය විසින් ඉඩම පවරා දීමට ප්‍රාදේශීය ලේකම් වෙත යොමු කර ඇති අතර, ප්‍රාදේශීය ලේකම් විසින් ඉඩම පරීක්ෂා කර මැනීම සඳහා මිනින්දෝරු දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇත. ඉඩම මැනුම් කර භාරදීමෙන් පසු ගොඩනැගිල්ල ඉදිකිරීමේ කටයුතු ආරම්භ කිරීමට සැලසුම් කර ඇති බව කාරුණිකව සඳහන් කරමි. | ඉඩම පවරා ගැනීමේ කටයුතු සහ ගොඩනැගිල්ල ඉදිකර ගැනීමේ කටයුතු අප්‍රමාදව ඉටුකර ගත යුතුය. |

## 3.5 කළමනාකරණ දුර්වලතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | දෙපාර්තමේන්තුව විසින් ජනතා වතු සංවර්ධන මණ්ඩලයට සහ ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට අයත් රත්නපුර, කෑගල්ල සහ මොනරාගල දිස්ත්‍රික්කවල පිහිටි ඉඩම් අක්කර 152 ක පැළතවාන් 04 ක් පවත්වාගෙන තිබුණු අතර මෙම ඉඩම් දෙපාර්තමේන්තුව වෙත පවරා ගැනීමට විගණිත දිනය දක්වා කටයුතු කර නොතිබුණි. | මෙම ඉඩම් පවරා ගැනීම සඳහා රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් අදාළ ආයතන වෙත ඉල්ලීම් කර ඇත. | ඉඩම් පවරාගැනීමේ කටයුතු කඩිනම් කළ යුතුය. |
| (ආ) | රබර් නැවත වගාව සහ නව වගාව සහනාධාර ක්‍රමය යටතේ දිස්ත්‍රික්ක 10 ක රබර් වගා සහනාධාර ලබාගත් වගාකරුවන් 31,143 දෙනෙකුගෙන් වගාකරුවන් 3,135 දෙනෙකු රබර් වගාව අත්හැර දැමීම නිසා ලබාදුන් සහනාධාර මුදලින් රු.116,551,556 ක් අයවීමට තිබුණි. | සහනාධාර ලබාගෙන කිරි කැපුම් මට්ටමට ළඟා වීමට පෙර අසාර්ථක බවට වාර්තාවන ඉඩම් සඳහා එකී ඉඩම් හිමියන්ගෙන් ඔවුන් වෙත ගෙවූ සහනාධාර මුදල් නැවත අයකර ගත යුතුවේ. මේ සම්බන්ධව ගොවීන් වෙත දන්වා යවනු ලැබේ. සහනාධාර මුදල් නැවත ගෙවීම පැහැර හරින අයට එරෙහිව නෛතික ක්‍රියාමාර්ග ගැනීමේ බලය හිමි වන්නේ රබර් උපදේශක මණ්ඩලයටය. මෙම උපදේශක මණ්ඩලය 2009 වසරේ සිටඅක්‍රිය වී ඇත. මෙම රබර් උපදේශක මණ්ඩලය ස්ථාපිත කරන ලෙස වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය වෙත පිලි යොමුකර ඇත. මේදක්වා රබර් උපදේශක මණ්ඩලය පිහිටුවා නොමැත. | රබර් වගා සහනාධාර ලබාගෙන වගාව අත්හැර දැමූ වගා කරුවන් ගෙන් අයවිය යුතු මුදල් අප්‍රමාදව අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | දෙපාර්තමේන්තුව සතු අක්කර 315 ක භූමි ප්‍රමාණයෙන් පැළතවාන් 08 ක් සඳහා අක්කර 224 ක භූමි ප්‍රමාණයක් සහ ආදර්ශ රබර් වගා සඳහා අක්කර 19 භූමි ප්‍රමාණයක් යොදවාගෙන තිබුණි. මේ අනුව භූමි ප්‍රමාණයෙන් අක්කර 72 ක් පැළ තවාන් සඳහා හෝ | ක්‍රියාකාරී සැලැස්මෙන් ලබා දෙන වාර්ෂික නිම් පැළ ඉලක්කය පදනම්ව, වාර්ෂිකව රජයේ රබර් පැළ තවාන් 08 සඳහා ලබා දෙන නිම් පැළ ඉලක්කය, නිෂ්පාදනය කර ගැනීම සඳහා අවශය බිම් | ප්‍රයෝජනයට නොගත් අක්කර 72 ඵලදායී කාර්යයන් සඳහා උපයෝජනය කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | ආදර්ශ රබර් වගාවන් සඳහා යොදවා ගෙන නොතිබුණි. | ප්‍රමාණය පමණක් ප්‍රයෝජනයට ගෙන ඇත. තවද ප්‍රයෝජනයට නොගන්නා ඉතිරි බිම් ප්‍රමාණය ශුද්ධ කිරීම සඳහා යන්ත්‍ර සූත්‍ර යොදා ගැනීමට සහ කම්කරු ශ්‍රමය යොදා ගැනීමට විශාල පිරිවැයක් දැරීමට සිදු වීම, කම්කරුවන්ගේ දැඩි හිඟයක් පැවතීම සහ කොවිඩ් තත්ත්වය හමුවේ තවානෙහි සිටින කම්කරුවන්ගේද පැමිණීමේ අඩුවක් වූ නිසා එම ඉඩම් පැළ නිෂ්පාදනයට පමණක් භාවිතා කරන ලදී. | |
| **(ඇ)** | දෙපාර්තමේන්තුවට අයත් ලොරි රථ 03 ක් සහ කැබ් රථයක් ධාවනයට ගත නොහැකිව වර්ෂ 04 ක සිට වර්ෂ 09 ක් අතර කාලයක් පැවති අතර මෙම වාහන අපහරණය කිරීමට සමීක්ෂණ මණ්ඩලය විසින් තීරණය කර තිබුණද එම වාහන අපහරණය කිරීමට මෙතෙක් කටයුතු කර නොතිබුණි. | 2020 වර්ෂයේ සිට රට තුළ පැවති කොවිඩ් වසංගත තත්ත්වය හේතුවෙන් අදාළ අපහරණ කටයුතු සිදුකර ගැනීමට අපහසු විය | වාහන සඳහා වූ අපහරන කටයුතු අප්‍රමාදව සිදු කළ යුතුය. |
| **(ඉ)** | අංක **53-9302** දරන කැබ් රථය **2018** දෙසැම්බර් මාසයේ අනතුරකට පත්ව ඇති අතර අලුත්වැඩියා කිරීම ඵලදායී නොවන බව **2019** ජනවාරි මාසයේදී මෝටර් රථ පරීක්ෂණ වාර්තාවේ සඳහන්ව තිබුණද 2021 ජනවාරි මාසයේ රු.729,100 ක අලුත්වැඩියාවක් කටයුතු සඳහා ගරාජයකට ලබාදී එම අලුත්වැඩියා කිරීමේ කටයුතු මෙතෙක් අවසන්කර ගෙන නොතිබුණි. | කොවිඩ් වසංගතය හේතුවෙන් වාහනය අලුත්වැඩියාව ප්‍රමාදවී ඇති අතර මාස 06 ක් ඇතුළත අලුත්වැඩියාව සිදුකර දෙන මෙන් ගරාජය වෙත දන්වා ඇත. | මෝටර් වාහන පරීක්ෂකගේ නිර්දේශය ක්‍රියාත්මක කළ යුතුය. |
| **(ඊ)** | දෙපාර්තමේන්තුවට වෙනත් අමාත්‍යාංශ වලින් ලැබුණු වාහන 03 ක් සහ ලංකා බැංකුවෙන් මූල්‍ය කල්බදු ක්‍රමය යටතේ ලද වාහනයක් ආයතනය නමින් පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | මෙම පවරා ගැනීමේ කටයුතු සිදු කරන බව දන්වමි. | දෙපාර්තමේන්තුව වෙත ලැබී ඇති වාහන පවරා ගැනීමේ කටයුතු කඩිනමින් සිදුකළ යුතුය. |

**4. මානව සම්පත් කළමනාකරණය**

**----------------------------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | --------------------- | --------------------------- | --------- |
| (අ) | 2021 දෙසැම්බර් 31 දිනට දෙපාර්තම්න්තුවේ අනුමත කාර්ය මණ්ඩලය 484 ක් වු අතර ඉන් තනතුරු 102 ක් පුරප්පාඩු පැවතිණි. එම පුරප්පාඩු අතුරින් ජ්‍යෙෂ්ඨ මට්ටමේ පුරප්පාඩු 14 යටතේ ශ්‍රී ලංකා පරිපාලන සේවයේ අධ්‍යක්ෂ තනතුරු 02 ක්, සහකාර අධ්‍යක්ෂ තනතුරු 04 ක් සහ ගණකාධිකාරී සේවයේ තනතුරු 03 ක් සඳහා 2020 වර්ෂයේ සිට නිලධාරීන් අනුයුක්ත කරවා ගෙන නොතිබුණි. | දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ මට්ටටේ තනතුරු සඳහා බඳවා ගැනීම සහ පුරප්පාඩු පිරවීම රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත්පාලන අමාත්‍යාංශ ලේකම් විසින් සිදු කරන බැවින් මෙම පුරප්පාඩු පිළිබඳව රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත්පාලන අමාත්‍යාංශයට දැනුම් දී ඇත. | මෙම පුරප්පාඩු පිරවිය යුතුය. |
| (ආ) | 2019 වර්ෂයේදී රබර් සංවර්ධන නිලධාරීන් 19 දෙනෙකු බඳවා ගැනීමට ලිඛිත පරීක්ෂණයක් පවත්වා 2021 ජූනි මාසයේදී පත්වීම් ලබාදෙන අවස්ථාවේදී අයදුම්කරුවන් 13 දෙනෙකු එම පත්වීම භාරගෙන නොතිබුණි. 2021 අගෝස්තු මාසයේදී වැවිලි අමාත්‍යාංශය විසින් නැවතත් රබර් සංවර්ධන නිලධාරීන් 55 දෙනෙකු බඳවා ගැනීමට අනුමැතිය ලබාදීමත් සමගම දෙපාර්තමේන්තුව විසින් 2021 සැප්තැම්බර් මාසයේදී බඳවා ගැනීම සඳහා පුවත්පත් දැන්වීමක් පළකර තිබුණි. ඒ සඳහා අයදුම්කරුවන් 281 දෙනෙකු දෙසැම්බර් මාසයේදී ලිඛිත පරීක්ෂණයකට පෙනී සිටියද මෙතෙක් කිසිවකු බඳවා ගෙන නොතිබුණි. | රබර් සංවර්ධන නිලධාරීන් බඳවා ගැනීම සඳහා ජාතික වැවිලි කළමනාකරණ ආයතනය විසින් විභාගය පවත්වා ඇති නමුත්, එම ආයතනය විසින් ප්‍රතිඵල නිකුත් කර නොමැති අතර, ප්‍රතිඵල නිකුත් කළ පසු බඳවා ගැනීමේ කටයුතු සිදු කිරීමට කටයුතු කරමින් පවතී. | මෙම පුරප්පාඩු පිරවිය යුතුය. |

.